# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/47 - 2018 ජූලි මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: KOT/LND/ACQVI/01/75
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/15/2017/VE/271

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 257 මොරවක ග්‍රාම නිලධාරි වසමේ මොරවක ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 4-40 හි අතිරේක අංක 26 හි පත්‍ර 30 හි කැබලි අංක 699 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2017 ක් වූ බොගතුගහහේන *නොහොත්* බොකුටුගහහේන නමැති ඉඩම් කැබැල්ලට මායිම්;

**කැබලි අංක 699**

ප්‍රමාණය හෙක්ටයාර් 0.2017 ක් වූ බොගතුගහහේන *නොහොත්* බොකුටුගහහේන නමැති ඉඩම, ඉඩමේ අයිති ෆෙයරිමවුන්ට් තේ කර්මාන්ත ශාලාව අසල මොරවක පදිංචි රිදියගමගේ නන්දාවතී.

උතුරට: කැබලි අංක 698, 82F3 සහ 700; නැගෙනහිරට: කැබලි අංක 700 සහ 82E; දකුණට: කැබලි අංක 82E සහ 698; බටහිරට: කැබලි අංක 698 සහ 82F3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් ඇති සියලු දෙනාම තම තමන් හෝ සහ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් 2018.08.08 වැනි දින පෙ.ව. 10.00 ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තවද 2018.08.01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීමට වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්
කොටපොල.

2018 ජූලි මස 03 වැනි දින
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-629

1A - G 28012 - 17 (2018/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.